# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1473 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | திகதி<br>දිනය<br>Date | 26/11/2023<br>පැය 0540 |

## මාධ්‍ය නිවේදනය

**01.** **මනුෂ්‍ය ඝාතනයකට ආදල සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - මීරිගම පොලිස් ස්ථානය.**

2023.11.24 වන දින මීරිගම පොලිස් වසමේ මාකූර ප්‍රදේශයේ නිවසක කාන්තාවකට පොල්ලකින් පහරදී මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම සම්බන්ධයෙන් විමර්ශන සිදුකර සිද්ධියට අදාල සැකකරුවෙකු 2023.11.25 වන දින රාත්‍රී කාලයේදී මීරිගම පොලිස් වසමේ අඹේපුස්ස දුම්රියපොල අසලදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන මාකූර, අඹේපුස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මීරිගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02.** **රන්මාල කොල්ලකෑමේ අපරාධ රැසකට සම්බන්ධ සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පිංවත්ත පොලිස් ස්ථානයට වාර්තා වූ කාන්තාවකගේ ගෙල බැඳි රන් මාලයක් කොල්ලකෑමේ අපරාධයට අදාල සැකකරුවෙකු 2023.11.25 වන දින දහවල් කාලයේ පානදුර තට්ටු නිවාස අසලදී අත්අඩංගුවට ගෙන පිංවත්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35ක්වූ මූනගම, හොරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී පිංවත්ත, වාද්දුව, බණ්ඩාරගම, මතුගම, කළුතර උතුර පොලිස් ස්ථාන වෙත වාර්ථා වූ රන් මාල කොල්ලකෑමේ අපරාධයන් කිහිපයකට සම්බන්ධ සැකකරුවෙකු බවටද අනාවරණය වී ඇත.

සැකකරුගෙන් සිදුකල ප්‍රශ්න කිරීමේදී අපරාධයන් සඳහා සහය වූ තවත් සැකකරුවන් සිව් දෙනෙකු පානදුර, වෑකඩ, පිංවල ප්‍රදේශ වලදී අත්අඩංගුවට ගෙන පිංවත්ත ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් 28, 30,39 හා 53 වයස්වල පසුවන පිංවල හා වැකඩ යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම අපරාධ සඳහා යොදා ගත් යතුරුපැදි 02ක්ද අත්අඩංගුවට ගෙන ඇති අතර පිංවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2023.11.25 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රියපොල අසලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. ගංජා ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - වෙන්නප්පුව පොලිස් ස්ථානය.

2023.11.25 වන දින සවස් කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ මූදුකොටුව ප්‍රදේශයේදී වෙන්නප්පුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගංජා කිලෝ 06ක්** සන්තකයේ තබාගෙන මෝටර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27 හා 42 යන වයස් වල පසුවන දංකොටුව හා මහවැව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වෙන්නප්පුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. ගෝඩා සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.

2023.11.25 වන දින උදෑසන කාලයේ පමුණුගම පොලිස් වසමේ දැලතුර තුන්මෝදර ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට උපයෝගී කර ගන්නා ගෝඩා ලීටර් 1134 ක් (බැරල් 06)** ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු වයස අවුරුදු 24 ක්වූ දැලතුර, ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 06. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.

2023.11.25 වන දින උදෑසන කාලයේ කටුනායක පොලිස් වසමේ කෝවින්න, ආඩිඅම්බලම ප්‍රදේශයේදී පැලියගොඩ බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට උපයෝගී කර ගන්නා ගෝඩා ලීටර් 1620 ක් (බැරල් 08) ක් පෙරීමේ උපකරණ සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කෝවින්න, ආඬිඅම්බලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගල්කටස් වර්ගයේ ගිනි අවියක් හා විදේශ රටක නිෂ්පාදිත අත් බෝම්බයක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විතාරන්දෙණිය කඳවුර.**

2023.11.25 වන දින දහවල් කාලයේ වලස්මුල්ල පොලිස් වසමේ කිරිවැල්හේන ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විතාරන්දෙණිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගල්කටස් වර්ගයේ ගිනි අවියක් හා විදේශ රටක නිෂ්පාදිත අත් බෝම්බයක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වලස්මුල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන කිරිවැල්හේන, වලස්මුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වලස්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**